# ශ්‍රී ලංකා මහ බැංකුව
# නව ප්‍රකාශනයක් එළි දක්වයි

# මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය






කර්තෘ

**පී.සමරසිරි**

සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

මිළ රු. 250/-

" . . . . මූල්‍ය ක්‍රමය, මුදල්, මූල්‍ය වෙළෙඳපොලවල්, බැංකු කටයුතු, බැංකු අධීක්ෂණය, මූල්‍ය ප්‍රතිපත්තිය සහ වත්මන් ලෝක මූල්‍ය අර්බුදය යනාදී මූල්‍ය අංශයට සම්බන්ධ වැදගත් මාතෘකා රාශියක් පිළිබඳව සවිස්තරාත්මකව සිංහල භාෂාවෙන් රචිත පළමු ග්‍රන්ථය මෙය බව ප්‍රකාශ කිරීම නිවැරැදිය. මෙහි සංකීර්ණ මාතෘකා පිළිබඳව න්‍යායාත්මක කරුණු මෙන් ම ප්‍රායෝගික කරුණු ද ඉතාමත් සරල බස් වහරක් යොදාගෙන ඉදිරිපත් කොට ඇති බැවින් මෙම පොත පරිශීලනය කරන අයට ඉතා පහසුවෙන් සංකීර්ණ විෂය කරුණු අවබෝධ කරගත හැකිවනු ඇත.

. . . . . . . මෙම ග්‍රන්ථයේ අඩංගු විෂය කරුණු දෙස බැලීමේදී අ.පො.ස. (උසස් පෙළ), විශ්ව විද්‍යාල සහ වෘත්තීයමය පාඨමාලාවන්හි මූල්‍ය සේවා සහ ආර්ථික විද්‍යාව හදාරන සිසුන්ට මෙන් ම ගුරුවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ උගතුන්ට මෙය ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්ථයකි. . . . . . . . . "

- **අජිත් නිවාඩ් කබ්රාල්,** අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

**රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශන අලෙවි අංශයෙන් දැන් මිළදීගතහැකිය.**

**ශ්‍රී ලංකා මහ බැංකුව**
ජනාධිපති මාවත
කොළඹ 01

විමසීම්: දු.ක. 2477834/2477829



අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

## මෙම පොත සහ කතුවරයා ගැන...

මෙම මූල්‍ය විෂයානුබද්ධ ග්‍රන්ථය පී. සමරසිරි මහතා විසින් සැකසීම ජාතික කර්තව්‍යයක් ඉටු කිරීම බව මගේ හැඟීමයි. මූල්‍ය අංශයට සම්බන්ධ විෂයයන් තවමත් වැඩි වශයෙන් දියුණු බටහිර රටවල ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යයනය සහ පරිහරණය කෙරේ. දියුණු මූල්‍ය අංශයන් දක්නට ලැබෙන්නේ ද එම රටවලය. මූල්‍ය අංශය පිළිබඳව අධ්‍යයන කටයුතු සඳහා පරිශීලනයට සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පොතපත නොමැති තරම්ය. මූල්‍ය ක්‍රමය, මුදල්, මූල්‍ය වෙළෙඳපොලවල්, බැංකු කටයුතු, බැංකු අධීක්ෂණය, මූල්‍ය ප්‍රතිපත්තිය සහ වත්මන් ලෝක මූල්‍ය අර්බුදය යනාදී මූල්‍ය අංශයට සම්බන්ධ වැදගත් මාතෘකා රාශියක් පිළිබඳව සවිස්තරාත්මකව සිංහල භාෂාවෙන් රචිත පළමු ග්‍රන්ථය මෙය බව ප්‍රකාශ කිරීම නිවැරැදිය. මෙහි සංකීර්ණ මාතෘකා පිළිබඳව න්‍යායාත්මක කරුණු මෙන් ම ප්‍රායෝගික කරුණු ද ඉතාමත් සරල බස් වහරක් යොදාගෙන ඉදිරිපත් කොට ඇති බැවින් මෙම පොත පරිශීලනය කරන අයට ඉතා පහසුවෙන් සංකීර්ණ විෂය කරුණු අවබෝධ කරගත හැකිවනු ඇත.

සමරසිරි මහතා පසුගිය වසර 27 ක කාලය තුළ ආර්ථික හා මූල්‍ය විෂයයන් රාශියක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කිරීමෙන් ලද පෘථුල දැනුම මෙම ග්‍රන්ථය තුළින් මනාව පිළිබිඹු වෙයි. ආර්ථික විද්‍යාව පිළිබඳව කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගෞරව උපාධියක් ද ඇමෙරිකා එක්සත් ජනපදයේ කැන්සාස් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇති එතුමා දේශීය සහ විදේශීය වශයෙන් ආර්ථික සහ මූල්‍ය විෂයයන් පිළිබඳ පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයකට සහභාගි වී ඇති අතර ශාස්ත්‍රීය ලිපි රාශියක් පළකොට ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ ලෙස ද සේවය කළ ඒ මහතා දැනට මූල්‍ය ස්ථායීතා කාර්ය අංශය අධීක්ෂණය භාර සහකාර අධිපතිවරයා සහ මුදල් මණ්ඩලයේ ලේකම් වශයෙන් ද ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සභාපති වශයෙන් ද සේවය කරන අත්දැකීම් සහ දැනීම බහුල කෙනෙකි.

මෙම ග්‍රන්ථයේ අඩංගු විෂය කරුණු දෙස බැලීමේදී අ.පො.ස. (උසස් පෙළ), විශ්ව විද්‍යාල සහ වෘත්තීයමය පාඨමාලාවන්හි මූල්‍ය සේවා සහ ආර්ථික විද්‍යාව හදාරන සිසුන්ට මෙන් ම ගුරුවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ උගතුන්ට මෙය ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්ථයකි. ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සහ මූල්‍ය විෂයයන් සම්බන්ධ දැනීම මහජනයා අතර බෙදාහැරීමට විවිධ ප්‍රකාශනයන් සහ වැඩසටහන් යොදා ගන්නා අතර එහි එක් පියවරක් වශයෙන් සමරසිරි මහතාගේ මෙම කෘතිය ප්‍රකාශයට පත්කරනුයේ ඉතාමත් සතුටිනි. මෙම ග්‍රන්ථය තුළින් අනාගතයේ විශාල පිරිසකගේ මූල්‍ය දැනීම ප්‍රගුණ කෙරෙන බව මගේ දැඩි විශ්වාසයයි.



පී. සමරසිරි

මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය

පී. සමරසිරි

ISBN – 978-955-575-199-5

ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය, රාජගිරිය

මිළ රු. 250/-

# මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය

පී. සමරසිරි



ශ්‍රී ලංකා මහ බැංකුව